# Joint Council for Professions of Supplementary Medicine

# පරිපූරක වෛද්‍ය සේවා ඒකාබද්ධ බලමණ්ඩලය

# நிறைவுகாண் மருத்துவ தொழில் வல்லுநர் ஒன்றியம்

PSM


**Official email:**
nonmbbshealthprofessionals@gmail.com

**Official Address:**
No 889/1/1,
Maradana Road,
Colombo 10
Sri Lanka

**President:**
Ravi Kumudesh
077 307 7717
kumudeshr@gmail.com

**Co -President:**
Thushara Ranadeva
071 800 6050
ranadevaktp@gmail.com

**Secretary:**
Chanaka Dharamawickrama
071 865 8620
hwchanaka@gmail.com

**Assistant Secretary:**
Lesantha Chathuranga
071 268 4421
lesanthacvaw@gmail.com

**Treasurer:**
Chandana Perera
071 193 0166
chandanaotlrh@gmail.com


මගේ අංකය: JCPSM/Gen/2024 (33)
දිනය: 2024.08.16

1. සමන් ශ්‍රී රත්නායක මහතා, මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමා
2. ආර්. එම්. ඒ. එල්. රත්නායක මහතා, සභාපති - මැතිවරණ කොමිෂන් සභාව
   මැතිවරණ මහලේකම් කාර්යාලය
   නො.02, සරණ මාවත
   රාජගිරිය

**<u>උතුරු පළාත් සභාවේ රෝහල්/ සෞඛ්‍ය ආයතන යටතේ ඇති පරිපූරක වෛද්‍ය සේවාවේ තනතුරු වල පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනමින් වෘත්තිකයන් බඳවා ගැනීමේ හදිසි උත්සහයක් දැරීම.</u>**

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සැලසුම් අංශයේ සේවය කරනු ලබන බව පවසා ඇති Rajeev G Moorthy නම් තැනැත්තෙකුගේ යැයි හැඟෙන පෞද්ගලික Facebook ගිණුමක උක්ත කරුණට අදාලව සිදු කරන ලද ප්‍රසිද්ධ දැනුවත් කිරීම අනුව ඊට අදාල වැඩිදුර විස්තර දැනගැනීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය සමන් පතිරණ මහතා දුරකථනය ඔස්සේ සම්බන්ධ කර ගනු ලැබුවද එම අවස්ථාවේදී එතුමා විසින් දක්වන ලද අයහපත් ප්‍රතිචාරය හමුවේ මෙම පැමිණිල්ල යොමු කරන අතර ඊට අදාල ඔබතුමන්ලාගේ කඩිනම් මැදිහත්වීම ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

පරිපූරක වෛද්‍ය සේවාවට අදාල උපාධිධාරීන් වාර්ෂික විශ්වවිද්‍යාල වලින් පිටවන අතර පවතින සේවා අවශ්‍යතාවය අනුව හා දිවයින පුරා පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් බඳවා ගැනීම් සිදු කර අදාල සේවා ස්ථාන වෙත පත් කරන අතර මේ වන විටත් ඊට අදාල කටයුතු විධිමත් පරිදි සිදුවෙමින් පවතී.

නිලධාරී හිඟය මත උතුරු පළාත් සභාව තුල පරිපූරක වෛද්‍ය සේවාවට අදාල වෘත්තීන්ගේ සේවා අඩාල වීමේ අවධානම් තත්වයක් පවතින්නේ නම් ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කිරීමත්, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අදාල පත්වීම සිදු කිරීම සඳහා මැදිහත් වීමත්, ඊට යම් ප්‍රමුඛතාවයක් ලබා ගැනීමට උත්සහ දැරීමත් අදාල පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ වගකීම හා යුතුකම වුවත් මෙතෙක් එවන් මැදිහත් වීමක් සිදු කර නොමැති බව පෙන්වා දෙන අතරම ජනාධිපතිවරණ මැතිවරණය අතරතුර කොන්ත්‍රාත් පදනමින් වෘත්තීකයන් බඳවා ගැනීමට උත්සහ දැරීම අසාමාන්‍ය තත්වයක් බවත් පෙන්වා දෙමු.

එබැවින් මීට අදාලව පහත කරුණු පිළිබඳව ඔබතුමන්ලාගේ දැඩි අවධානය යොමු කරන අතරම මැතිවරණ සමය තුල කොන්ත්‍රාත් පදනමින් නව පත්වීම ලබා දීම හරහා වැරදි පූර්වාදර්ශයක් ලබාදීමට හෝ අවිධිමත් බඳවා ගැනීම් හරහා පරිපූරක වෛද්‍ය සේවාවේ ගුණාත්මක තත්වය පහල දැමීමට උත්සහ දරන්නේ නම් ඊට නිසි මැදිහත් වීම් සිදු කරමින් අදාල කටයුත්ත අතිහිටුවීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

1. පරිපූරක වෛද්‍ය සේවාවට අදාලව උතුරු පළාත තුල පවතින පුරප්පාඩු ප්‍රමාණය ඉතාම සීමාසහිත වීම.
2. මෙම අවස්ථාවේදී පරිපූරක වෛද්‍ය සේවාවේ තනතුරු සඳහා උග්‍ර සේවා අවශ්‍යතාවයක් පවතින බව විදහාපාන නමුත් පසුගිය දශකය පුරාවට ඊට අදාලව නව තනතුරු ඇති නොකිරීම.
3. සිදුවෙමින් පවතින බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී උතුරු පළාත් සභාව වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා ගැනීමට නිසි පරිදි මැදිහත් නොවීම.
4. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනෙන්නේ විධිමත් සුදුසුකම් සැපිරූ උපාධිධාරීන් පමණක්ද යන වග.
5. බඳවා ගැනීමේ ක්‍රමවේදය විධිමත්, පාරදෘශ්‍ය හා සාධාරණ ක්‍රියාවලියක්ද යන වග.
6. වෘත්තීය සංගමය විසින් සිදුකරන විමසීම් හමුවේ දැඩි ස්ථාවරයක රැඳෙමින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හා නොරුස්සන ස්වරූපයෙන් ප්‍රතිචාර දැක්වීම.

ස්තුතියි!
මෙයට විශ්වාසී

රවී කුමුදේශ්
සභාපති

තුෂාර රණදේව
සම සභාපති

චානක ධර්මවික්‍රම
ලේකම්

පිටපත්:

1. ගරු ආණ්ඩුකාරතුමා - උතුරු පළාත
2. සෞඛ්‍ය ලේකම්තුමා, සෞඛ්‍ය අමාත්‍යාංශය
3. පළාත් සෞඛ්‍ය ලේකම්තුමා - උතුරු පළාත
4. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ සියළු දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු - උතුරු පළාත
5. ස්වාධීන මැතිවරණ නිරීක්ෂණ ආයතන සහ සංවිධාන



Rajeev G Moorthy
August 11 at 9:14PM ·

யாழ்ப்பாண மாவட்ட சுகாதார திணைக்களத்திலுள்ள பதவி வெற்றிடங்களைப் பூர்த்தி செய்வதற்காக வடக்கு மாகாண சபையினால் ஒப்பந்த அடிப்படையில் தகுதியுள்ளவர்கள் இணைத்துக் கொள்ளப்படவுள்ளனர்.
எனவே, பின்வரும் பதவிகளுக்கு பொருத்தமான தகுதிகளைக் கொண்டுள்ளவர்கள் அதற்கான விண்ணப்பப் படிவங்களை எதிர்வரும் திங்கட்கிழமை (12.08.2024) தொடக்கம் பண்ணை, சுகாதாரக் கிராமத்தில் அமைந்துள்ள யாழ்ப்பாண பிராந்திய சுகாதார சேவைகள் பணிமனையின் நிர்வாகக்கிளையில் பெற்று, பூர்த்தி செய்து சமர்ப்பிக்குமாறு கேட்டுக்கொள்ளப்படுகின்றீர்கள்.

விண்ணப்பங்களைப் பெற்று பூர்த்தி செய்து சமர்ப்பிக்க வேண்டிய இடம் -
பிராந்திய சுகாதார சேவைகள் பணிமனை - யாழ்ப்பாணம்
சுகாதார கிராமம், பண்ணை, யாழ்ப்பாணம்.

ஒப்பந்த அடிப்படையில் இணைத்துக்கொள்ளப்படவுள்ள பதவிகள் :
1. தாதிய உத்தியோகத்தர்

2. துணை மருத்துவ சேவைப் பதவிகள் -
i. மருந்தாளர் / மருந்துக்கலவையாளர்
ii. கதிரியக்கவியலாளர்.
iii. மருத்துவ ஆய்வுகூட தொழிநுட்பவியலாளர்.
iv. பேச்சு, மொழி சிகிச்சையாளர்.

3. தொழில்நுட்ப பதவிகள் -
i. உயிரியல் மருத்துவ தொழிநுட்பவியலாளர்.

4. பராமரிப்பு ஊழியர்கள்பதவிகள் -
i. வளிசீராக்கி பராமரிப்பு தொழநுட்ப வல்லுநர் .
ii. மின்னியலாளர்.
iii. பிளம்பர்
iv. மேசன்.

மேலதிக விபரங்களுக்கு நிர்வாகக்கிளையை தொடர்பு கொள்ளவும்.
0212222278, 0212211378
rdhsjaffna15@gmail.com

Calling Applications to recruit on contract basis by the Northern Provincial Council on behalf of the RDHS, Jaffna to the following Posts.
The eligible candidates are requested to collect the application forms and fill it up and submit.

https://www.facebook.com/share/pGKesRGcfLsypNEd/?

மேலதிக விபரங்களுக்கு நிர்வாகக்கிளையை தொடர்பு கொள்ளவும்.
0212222278, 0212211378
rdhsjaffna15@gmail.com

Calling Applications to recruit on contract basis by the Northern Provincial Council on behalf of the RDHS, Jaffna to the following Posts.
The eligible candidates are requested to collect the application forms and fill it up and submit.

Application forms can be collected from and returned to RDHS office-Jaffna, Health Village, Pannai, Jaffna from comming Monday onwards. (12.08.2024).

Posts to be required on contract basis:
1. Nursing Officers

2. Professions Supplementary to Medicine (PSM)
i. Pharmacist/ Dispenser
ii. Radiographer
iii. Medical Laboratory Technologist
iv. Speech and Language therapist

3.Technical Staff
i.Bio Medical Technician

4.Maintenance team
i. AC technician
ii. Electrician
iii. Plumber
iv. Mason

For further information please contact with the Admin Branch.
0212222278, 0212211378
rdhsjaffna15@gmail.com

- Regional Director of Health Services, Jaffna.

See Translation

Ubenthiran Theleepan and 16 others 1 comment 22 shares

Like Comment Send Share

Meanon Vinothiny
தகவலுக்கு நன்றி